# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,922 - 2015 ජූලි මස 03 වැනි සිකුරාදා - 2015.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1104 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1105 |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1101- B 80961—5,352 (2015/07)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 අගෝස්තු මස 10 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජුනි මස 17 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| මාතර | වැලිගම | වැලිගම් කෝරළය කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |
| මාතර | වැලිපිටිය | වටගෙදරමුල්ල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වැලිගම් කෝරළය විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

07-211

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2015 අගෝස්තු මස 03 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2015 ජුනි මස 16 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | හොරණ | තලගල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ රයිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

07-210

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### අතුරු වෛද්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුරෙහි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2015

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවෙහි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට අ. පො. ස. (උ. පෙළ) විභාගයේ 2010, 2011, 2012, 2013, 2014 යන වර්ෂවල සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

| සංකේත අංකය | පුහුණු පාඨමාලාවේ නම | පුහුණු කාල සීමාව | පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය |
|---|---|---|---|
| 1 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී අභ්‍යාසලාභීන් | වසර 1 මාස 03 | ඉංග්‍රීසි |

1. අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී ලබා ගන්නා ලද Z අගය අනුව කුසලතා ලේඛන සකස්කර දීප ව්‍යාප්ත කුසලතාවය මත 30%ක් ද, පළාත් කුසලතාවය මත 70%ක් ද වන ලෙස සුදුස්සන් තෝරාගනු ලැබේ. පුහුණු පාඨමාලාවට එම පළාත්වලින් බඳවාගත හැකි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එම පළාතේ පවතින රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු ප්‍රමාණය පදනම් කර ගනිමින් තීරණය කරනු ලැබේ.

   මෙම පාඨමාලාව සඳහා අ.පො.ස. (උ.පෙළ) විභාගයේ Z අගය පදනම් කරගෙන වර්ෂ කිහිපයක උසස් පෙළ සමතුන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති බැවින්, පුහුණුව සඳහා අවශ්‍ය මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව තෝරා ගැනෙනුයේ ඉහත සඳහන් වර්ෂවල සුදුසුකම් ලත් මුළු අයදුම්කරුවන්ගේ එකතුවෙන් එම වර්ෂවල සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයක් වශයෙනි. අයදුම් කරන පළාත තුළ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුරෙහි පුරප්පාඩු නොමැති වුවහොත් එම පළාත්වලින් අයදුම් කරන අයදුම්කරුවන් දීප ව්‍යාප්ත කුසලතාවය මත පමණක් පදනම්ව තෝරාගනු ලැබේ.

2. මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. (සතියේ දින පහේ සහ සෙනසුරාද පෙරවරුවේ). විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම්කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත්කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් **ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

   2.1 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් පාඨමාලාවට බඳවාගන්නා දින වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගී නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුවද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින් එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

   2.2 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

සැළකිය යුතු ය :

* ඉහත 2.1 සිට 2.2 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන්ම මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේ ය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මඟින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබාගත යුතු ය.

* එම 2.1 සිට 2.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

* එමෙන්ම ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද, 2.1 සිට 2.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගත යුතු ය.

3. අධ්‍යාපන සුදුසුකම් හා පුහුණුවට බඳවා ගැනීමට අදළ වෙනත් විශේෂ සුදුසුකම් :

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 1 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ.පො.ස. (සා.පෙළ) සමත්වීම. | 2010, 2011, 2012, 2013, 2014 යන වර්ෂවල අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම. | නැත |

4. අනෙකුත් පොදු සුදුසුකම් :

(අ) 2015.08.03 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. අදළ සුදුසුකම් සපුරන 2010, 2011, 2012, 2013, 2014 යන වර්ෂවල අ.පො.ස. (උ.පෙළ) සමතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(ආ) පුහුණුවෙන් පසු බඳවා ගන්නා තනතුරෙහි අවම වශයෙන් වසර 10ක් සේවයකළ යුතු ය.

(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(ඈ) තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 3ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය.

5. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතු ය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදසි භාවිතා කළ යුතු ය. අයදුම්පතේ 1 සිට 10 (අ) දක්වා පළමු පිටුවේ ද, 10 (ආ) සිට 13 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතුය.

(ආ) අයදුම්පතෙහි " 'ලදුපත' යන ස්ථානයේ ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - විභාග ගාස්තු රැස් කිරීම යන ගිණුමට" රු. 300 බැර කර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් ලබා ගන්න.)

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/ සාමදන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360/කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "අතුරු වෛද්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2015" යනුවෙන් සඳහන් කර, ඊට පහළින් ඔබ ඉල්ලුම් කරන පළාත හා දිස්ත්‍රික්කය සඳහන් කොට 2015.08.03 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

6. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබාගත යුතු ය.

7. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

8. නියමිත දිනට පසුව ලැබෙන හෝ අසම්පූර්ණ හෝ ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරතව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් හා වෙනත් අමාත්‍යාංශයක මාණ්ඩලික නිලධාරියෙකුගේ නියෝජනයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය. :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමග ද අමුණා එවිය යුතු ය.)

(ඈ) අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත,

(ඇ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය.)

(ඉ) ඉහත 5 (ඇ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ග්‍රාම නිලධාරී සහතිකය),

(ඊ) සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටින බවට දිවුරුම් ප්‍රකාශයක්.

පුහුණු කිරීමේ පටිපාටිය :

(i) සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.

(ii) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල පැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝග වලට යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩුවලට අදාළ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

(iv) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රු. 12,360ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් අදාළ පළාතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, (පුහුණුව හැරගියහොත්), ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත්, හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ හෝ පළාත් සභාවේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරණ ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. සේවයේ නියුක්ත කරවීමේ නියමයන්

පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ පළාත තුළ පවත්නා පුරප්පාඩු මත මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුරේ III වන පංතියේ තනතුරට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දහයක් යනතෙක් මුල් පත්වීම් ලබන පළාතේ සේවය කිරීම අනිවාර්යය වේ.

පාඨමාලාව අවසානයේදී පැවැත්වෙන අවසන් ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සකස් කරනු ලබන කුසලතා ලේඛනය පදනම් කරගෙන සහ ඉහත පළාත් මට්ටමෙන් බඳවාගනු ලැබූ 70% ක ප්‍රතිශතය හා දීප ව්‍යාප්ත කුසලතාවය මත බඳවාගනු ලැබූ 30%ක ප්‍රතිශතය ද සැලකිල්ලට ගෙන පුරප්පාඩු පවතින ආයතන වෙත පත්වීම් ලබාදීමට සලකා බැලීම සිදුකෙරේ. එහිදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) හි MT 04 2006A (රු. 15,080 - 180 x 7 - 240 x 3 - 320 x 11 - 360 x 20 -රු. 27,780) වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරෙහි තබා වැටුප් ගෙවනු ඇත.

11. අයදුම්පත පිරවීමේ දී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහ කරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. ඉහත පරිදි බඳවාගන්නා ලද සියලුමදෙනා රජයේ සේවකයින්ට අදළ වන සියලුම නීතිරීති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

14. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උද වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

15. පුහුණුවට බඳවාගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම පුහුණුවෙන් පසුව ඔබ අදල තනතුරේ පත්වීම් ලදහොත් ඉන් පසුව ද, පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර ඇති බවට අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

ආචාර්ය ඩී. එම්. ආර්. බී. දිසානායක,
ලේකම්,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2015 ජූනි මස 15 වැනි දින,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

අතුරු වෛද්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුරෙහි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2015

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය හොඳින් කියවා බලන්න

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසියෙන් කැපිටල් අකුරෙන්) උද : A. B. C. SILVA

(ආ) සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |
(පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

.................................... ....................................
.................................... ....................................
.................................... ....................................
.................................... ....................................

4. (අ) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

.................................... ....................................
.................................... ....................................
.................................... ....................................
.................................... ....................................

(ආ) දුරකථන අංක : ජංගම | | | | | | | | | | | ස්ථාවර | | | | | | | | | | |

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය : සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද?: ඔව්/නැත :————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද ? :—————.

5. උපන් දිනය : වර්ෂය :—————, මාසය :—————, දිනය :—————.

2015.08.03 දිනට වයස ඃ අවුරුදු :—————. මාස :—————. දින :—————.

6. උස : අඩි :—————. අඟල් :—————.

7. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ ස්ත්‍රී - ☐ පුරුෂ - ☐ (අදළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

8. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද? යන වග : ඔව් - ☐ නැත - ☐ (අදළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

9. විවාහක/අවිවාහක බව : විවාහක : ☐ අවිවාහක : ☐ (අදළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

10. අධ්‍යාපන සුදුසුකම්:

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාගය [Z අගය සහිත ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න].

විභාගයට ඉදිරිපත් වූ දිස්ත්‍රික්කය :—————.

විභාගයට පෙනී සිටි වර්ෂය :—————. විභාග අංකය :—————.

Z අගය :—————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාගය [ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න].

| # | විෂයය | පළමුවර | | දෙවනවර | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය : | | වර්ෂය : | |
| | | විභාග අංකය : | | විභග අංකය : | |
| | | සාමාර්ථය | | සාමාර්ථය | |
| 1 | සිංහල භාෂාව /දෙමළ භාෂාව | | | | |
| 2 | ගණිතය | | | | |
| 3 | විද්‍යාව | | | | |
| 4 | ඉංග්‍රීසි | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |

* ඔබ විසින් අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිටි සියලු විෂයයන් ඉහත වගුවෙහි සඳහන් කළ යුතු වේ.

11. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් - ☐ නැත - ☐

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නම් විස්තර සපයන්න. :————.

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මා විසින් ගැසට් නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගී නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දන සිටිමි.

| ලදුපත මෙහි නොගැලවෙන සේ අලවන්න |
|---|

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බව ද, ඔහු/ඇය .................................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන

දිනය :————.

* සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
* තනතුර :————.
* ලිපිනය :————.

සහතික කරන්නාගේ නිල මුද්‍රාව :————.

07-102

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2014

### ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය

01. කතෝලික යොවුන් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය ලෙස හඳුන්වනු ලබන මෙම විභාගය 2015 ඔක්තෝබර් මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

02. *විභාග මධ්‍යස්ථානය.*- දිවයින තුළ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන ලෙස අයැදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි විභාග මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව I වැනි උපලේඛනයේ දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය.*-මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්.*-මෙම විභාගය සඳහා ඉල්ලුම්කරන සෑම අයදුම්කරුවෙකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.

4.1 කතෝලික දහම් පාසලක 10 වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරතවීම.

4.2 ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක.) විෂයයෙන් සමත්ව සිටීම හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් කතෝලික ධර්මය (ක්‍රිස්තු ධර්මය රෝ. ක.) විෂයයෙන් සමත්ව සිටීම.

4.3 ඒ ඒ රදගුරුවසම්වල පවත්වන වාර්ෂික ධර්මෝපදේශ විභාගයේ එකොලොස්වන වසර සමත්වීම

සටහන.- (i) මෙම විභාගය සඳහා ඉදිරිපත්වන සෑම අයදුම්කරුවකු ම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ මිසම්භාර පූජාප්‍රසාදිතුමකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ii) විභාග අපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයැදුම් කිරීම* :

5.1 කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සඳහා විභාග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සියලු ම දහම් පාසල්වලට අවශ්‍ය ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා යථා කාලයේ දී සපයනු ලැබේ. නියමිත දින වකවානු තුළ ඉල්ලුම්පත්‍ර නොලැබුණහොත්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් සංඛ්‍යාව යන විස්තර සඳහන් ලිපියක් 5.6 ඡේදයේ සඳහන් ලිපිනයට 2015.07.15 වැනි දිනට පෙර දැන්විය යුතු ය.

5.2 කවර හෝ අයදුම්කරුවකුට බාහිර අයදුම්කරුවකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයෙකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 150 ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබාදෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුක්තව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු අතර දෙවන පිටපත ප්‍රධානාචාර්යවරයා වෙත තබා ගත යුතු ය. අයදුම්පත්‍ර දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතු ය.

5.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2015.08.03 වැනි දින වේ.

5.5 අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර, ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු ය. දුරකථන පහසුකම් ඇත්නම් එම අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය 2014" යනුවෙන් ද ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය. කිසිම සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.7 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන විදුහල්පතිවරයා හෝ පූජාප්‍රසාදීතුමා හෝ වගකිව යුතු ය.

5.8 විභාගයට ඉදිරිපත් කරන සියලුම අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ඇති තොරතුරු පෞද්ගලිකවම පරීක්ෂාකර බලා අත්සන් කළ යුතු ය.

5.9 අයදුම්කරුවන්ගේ අත්සන් කර නැති, මකන දියර භාවිත කරන ලද හා වෙනත් අඩුපාඩුකම් සහිත ඉල්ලුම් පත්‍ර මෙන්ම ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *විභාග ගාස්තු.*—මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු. 150 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා වන විෂයයට විභාග ගාස්තු රු. 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම.*- විදුහල්පතිතුමා විසින් ගාස්තු ගෙවිය යුතු සියලු ම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතුකොට දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම සම්පූර්ණ මුදල ගෙවා ලදුපතක් ලබාගෙන එම ලදුපත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම.*- කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

07. *ප්‍රවේශ පත්‍ර.*—විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයැදුම්කරුවකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත භාරදිය යුතු ය. යම් අයැදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටිනම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටීනම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයැදුම්කරුගේ අත්සන, දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා හෝ මිසම් භාර පූජාප්‍රසාදීතුමා හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයෙකු හෝ වර්ෂයකට රු. 240,360 කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර සේවයෙහි නියුතු නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුයි.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවක ම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය.

1. විභාගයේ නම :
2. දහම් පාසලේ නම :
3. දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය

4. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය
5. ඉල්ලුම්කළ විභාග මධ්‍යස්ථානය/නගරය
6. ඉල්ලුම් පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය
7. ලිපිය ලියාපදිංචි කළ අංකය සහ දිනය
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපත් අංකය, දිනය සහ තැපැල් කාර්යාලය.

08. *අනන්‍යතාව.-* එක් එක් ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින සෑම අවස්ථාවකම විභාග ශාලාධිපති වෙත අපේක්ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා සූදානම් ව සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

8.2 වලංගු විදේශ ගමන් බලපත්‍රය,

8.3 තැපැල් හැඳුනුම්පත.

09. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම :*

මෙම විභාගය සඳහා නියමිත විෂයය ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයකුම එම විෂයය හතරෙන්ම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි වර්ෂ දෙක (02) ඇතුළත දී එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය. (මෙය 2012 වසරේ පැවැත්වෙන විභාගයේ සිට බලපැවැත්වේ.) **ඌන සාමාර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යෙන්ම ඌන සාමාර්ථ්‍යය ලැබූ විෂයයට පමණි.**

9.1 සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් හිමිවන අතර, සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ඨ සම්මාන | D |

9.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර .-* මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ.

11. *උත්තරපත්‍ර නැවත සමීක්ෂණය.-* දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින්වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථාව සහ විෂයය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2015 ජුනි මස 15 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

**කතෝලික ධර්මය**

2007 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා විෂයය නිර්දේශය

මේ විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 04කින් සමන්විත ය.

I වන ප්‍රශ්න පත්‍රය

**කතෝලික විශ්වාසය**

(අ) මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ එන මූලික ඉගැන්වීම් පදනම් වේ.

* *මැවුම්කරුවාණෝ*
  - විශ්වයේ ප්‍රභවය
  - මැවිල්ලේ අසිරිය
  - මැවිල්ල සුරැකීම (උත්පත්ති 1, 2, 3)

* *ගැලවුම්කරුවාණෝ*
  - ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ (ජොහන් 1 : 1-14)
  - දේව රාජ්‍ය පිළිබඳ ඉගැන්වීම් (මතෙවු 5, 6, 7)
  - උපමා (මතෙවු 13:1-52)
  - ප්‍රාතිහාර්ය (ජොහන් 11:38-45, ලූක් 8:26-39), මාක් 2:1-12, මාක් 4:35-41)

* *ශුද්ධාත්මයාණෝ*
  - ක්‍රියාකාරීත්වය (ජොහන් 7:37-39, 14:15-31, 16:5-15) 1 කොරින්ති 12:4-11)

* *කිතුනු සභාව*
  - ඒකත්වය, ශුද්ධත්වය, සාධාරණත්වය සහ අපෝස්තලිකත්වය
  - සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස

* රෝම 12:4-21

* 1 කොරින්ති 12:12-31
  - සභාවේ පාලන සැලැස්ම
  - නිල බලය ලත් සේවය
  - පැවිදි සේවාවන්
  - ගිහි සේවාවන්

* *රූපාන්තර පරිවර්තනය*
  - මනුෂ්‍යාගේ අවසාන සිද්ධි
  - අලුත් අහසක්, අලුත් පොළොවක් (එළිදරව්ව 21:1-4)

II වන ප්‍රශ්න පත්‍රය

**කතෝලික ජීවිත පැවැත්ම**

(ආ) කතෝලික ජීවිත පැවැත්මට පන්නරය ලැබෙන ජනවන්දනාව

* දිව්‍ය පූජාව සහ පූජා පිළිවෙත
* පාස්කු අභිරහස
* දේව වරප්‍රසාද
* ප්‍රසාද නිධාන (පොදු ලක්ෂණ)

* ආරම්භ ප්‍රසාද නිධාන
  * ප්‍රසාද ස්නාපනය
  * අභිවෘද්ධි ආලේපය
  * දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

* සුවය ලබාගැනීමේ ප්‍රසාද නිධාන
  * සමගි සන්ධානය
  * රෝගීන්ගේ ආලේපය

* සේවය සඳහා ස්ථාපිත ප්‍රසාද නිධාන
  * පූජකවරය
  * ආශිර්වාදකාර බන්ධනය

III වන ප්‍රශ්න පත්‍රය

**කතෝලික සදාචාරාත්මක ජීවිතය**

(ඉ) කතෝලික සදාචාරය
  * දස පනත සහ ප්‍රේමයේ පනතේ පැතිකඩ දෙක
  * දස පනත පූර්ණත්වයට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ (මතෙව් 5:21-47)
  * තැනිතලා ස්ථානයේ දේශනය (ලූක් 6:17-49)
  * බුද්ධිය, නිදහස් කැමැත්ත සහ හැඟීම්
  * දේව සම්බන්ධ ධර්ම ගුණ
  * හෘද සාක්ෂිය
  * දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම (1-3 පනත්)
  * අසල්වැසියාට ප්‍රේම කිරීම (4-10 පනත්)
  * දස පනත තුළින් මතුවිය යුතු සාරධර්ම
  * කතෝලික අනන්‍යතාව

IV වන ප්‍රශ්න පත්‍රය

**යාච්ඤාවේ ජීවිතය**

(ඊ) දේව සබඳතා ගොඩ නැගෙන යාච්ඤාව
  * පුරාණ ගිවිසුමේ යාච්ඤාව
    - අබ්‍රහම්
    - මෝසෙස්

  * නව ගිවිසුමේ යාච්ඤාව
    - ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ විශේෂ අවස්ථා
    - යාච්ඤාව පිළිබඳ විශේෂ ඉගැන්වීම් (ලූක් 11:1-13)

  * සභා ජීවිතය තුළ යාච්ඤාව
    - ප්‍රශංසාව
    - තුති පිදීම
    - යැදුම
    - මැදහත් යැදුම
    - භාවනාත්මක යාච්ඤාව

* ස්වාමිවාක් ආරාධනයේ ඉල්ලීම් හත
  - ඔබගේ නාමයට ප්‍රශංසා වේවා
  - ඔබගේ රාජ්‍යය පැමිණේවා
  - ඔබගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් මොලොවෙහි ඉටුවේවා
  - අපගේ එදිනෙදා භෝජනය අද අපට දානය කළ මැනව
  - අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදි ද කමා කළ මැනව
  - පාප අවස්ථාවන්ට අසුවීමට අපට ඉඩ නොදුන මැනව
  - අයහපතින් අප මුදා ගත මැනව

* විවිධ භක්ති අභ්‍යාස
  - ජපමාලය
  - නුවාන
  - ශුද්ධ පැය

**පරිශීලනය කළ යුතු ග්‍රන්ථ**

- නව කතෝලික ධර්මෝපදේශය
- මහෝපදේශය
- ශුද්ධ බයිබලය (නියමිත කොටස්)
- II වැනි වතිකාන ප්‍රකාශන

* ජනවන්දනාව
* වර්තමාන ලෝකයේ ශුද්ධ සභාව
* ක්‍රිස්තුන් වහන්සේගේ සභාව
* ගිහි ධර්මදූත සේවය

I උපලේඛනය

ඒ ඒ දිස්ත්‍රික්කයන්හි විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක

**දිස්ත්‍රික්කය 01 - කොළඹ**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| බොරැල්ල | 0101 |
| කලුඅග්ගල | 0102 |
| පන්නිපිටිය | 0103 |
| මොරටුව | 0104 |

**දිස්ත්‍රික්කය 02 - ගම්පහ**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මීගමුව | 0205 |
| කඳාන | 0206 |
| ගම්පහ | 0207 |
| රාගම | 0208 |

**දිස්ත්‍රික්කය 03 - කළුතර**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කළුතර | 0309 |

**දිස්ත්‍රික්කය 04 - ගාල්ල**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| ගාල්ල | 0410 |

**දිස්ත්‍රික්කය 05 - මාතර**

| නගරය | නගර අංකය |
|---|---|
| මාතර | 0511 |

**දිස්ත්‍රික්කය 06 - හම්බන්තොට**

| නගරය | නගර අංකය |
|---|---|
| හම්බන්තොට | 0612 |

**දිස්ත්‍රික්කය 07 - රත්නපුර**

| නගරය | නගර අංකය |
|---|---|
| රත්නපුර | 0713 |

**දිස්ත්‍රික්කය 08 - කෑගල්ල**

| නගරය | නගර අංකය |
|---|---|
| කෑගල්ල | 0814 |

**දිස්ත්‍රික්කය 09 - පුත්තලම**

| නගරය | නගර අංකය |
|---|---|
| පුත්තලම | 0915 |
| හලාවත | 0916 |
| වෙන්නප්පුව | 0917 |

**දිස්ත්‍රික්කය 10 - කුරුණෑගල**

| නගරය | නගර අංකය |
|---|---|
| කුරුණෑගල | 1018 |
| කුලියාපිටිය | 1019 |
| නිකවැරටිය | 1020 |

**දිස්ත්‍රික්කය 11 - මහනුවර**

| නගරය | නගර අංකය |
|---|---|
| මහනුවර | 1121 |

**දිස්ත්‍රික්කය 12 - මාතලේ**

| නගරය | නගර අංකය |
|---|---|
| මාතලේ | 1222 |

**දිස්ත්‍රික්කය 13 - නුවරඑළිය**

| නගරය | නගර අංකය |
|---|---|
| තලවකැලේ | 1323 |

**දිස්ත්‍රික්කය 14 - බදුල්ල**

| නගරය | නගර අංකය |
|---|---|
| බදුල්ල | 1424 |

**දිස්ත්‍රික්කය 15 - මොණරාගල**

| නගරය | නගර අංකය |
|---|---|
| මොණරාගල | 1525 |

**දිස්ත්‍රික්කය 16 - අනුරාධපුරය**

| නගරය | නගර අංකය |
|---|---|
| අනුරාධපුරය | 1626 |

**දිස්ත්‍රික්කය 17 - පොළොන්නරුව**

| නගරය | නගර අංකය |
|---|---|
| හිඟුරක්ගොඩ | 1727 |

**දිස්ත්‍රික්කය 18 - ත්‍රිකුණාමලය**

| නගරය | නගර අංකය |
|---|---|
| ත්‍රිකුණාමලය | 1828 |

**දිස්ත්‍රික්කය 19 - මඩකලපුව**

| නගරය | නගර අංකය |
|---|---|
| මඩකලපුව | 1929 |

**දිස්ත්‍රික්කය 20 - අම්පාර**

| නගරය | නගර අංකය |
|---|---|
| අම්පාර | 2030 |
| කල්මුනේ | 2031 |

**දිස්ත්‍රික්කය 21 - යාපනය**

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 2132 |
| මානිප්පායි | 2133 |
| පරුත්තිතුරෙ | 2134 |
| නෙඩුන්තීවු | 2135 |

**දිස්ත්‍රික්කය 22 - මුලතිව්**

| නගරය | නගර අංකය |
|---|---|
| කිලිනොච්චිය | 2236 |
| මුලතිව් | 2237 |
| මුලංගාවිල් | 2238 |

**දිස්ත්‍රික්කය 23 - මන්නාරම**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| මන්නාරම | 2339 |
| මුරුංගන් | 2340 |
| ආන්ඩාංකුලම් | 2341 |
| පෙරිය පන්ඩිවිරිස්සාන් | 2342 |

**දිස්ත්‍රික්කය 24 - වව්නියාව**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| වව්නියා | 2443 |

07-201

---

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවා ගණය - යන්ත්‍ර සහායක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2015

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවා ගණයේ යන්ත්‍ර සහායක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පමණක් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් යන්ත්‍ර සහායක III ශ්‍රේණියේ තනතුරේ පුරප්පාඩු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

02. *වැටුප් ක්‍රමය.*—අංක 06/2006 (iv) හා 2007/08/24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයට අනුව යන්ත්‍ර සහායක තනතුරෙහි III, II, I හා විශේෂ ශ්‍රේණිවලට අදළ මාසික වැටුප් පරිමාණය.

රු. 11,730/-10x120-10x130-10x145-12x160-රු. 17,600
රු. 12,930 න් ඔබ්බට යාම සඳහා II ශ්‍රේණියට උසස් වීමද
රු. 14,230 න් ඔබ්බට යාම සඳහා I ශ්‍රේණියට උසස් වීමද
රු. 15,680 න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය.

03. *සේවා කොන්දේසි :*

මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරුවිශ්‍රාම වැටුප් අරමුදලට අදළ පරිදි දායක විය යුතුය. මෙම තනතුර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට සීමා වූ තනතුරකි. එසේ වුවද දෙපාර්තමේන්තුව තුළ දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත් කරනු ලැබිය හැකිය. මෙම සේවා ගණයේ III ශ්‍රේණියට පවත්නා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් බඳවාගන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.

04. සුදුසුකම් :

යන්ත්‍ර සහායක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදළ වේ.

(අ) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු : 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම් සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1997.08.03 දින හෝ ඊට පෙර හා 1970.08.03 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.
අධ්‍යාපන සුදුසුකම් :

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

(ඉ) වෘත්තීය සුදුසුකම් :
(i) අදළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඊ) පළපුරුද්ද : අදළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(උ) කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ii) සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ නියමිත සුදුසුකම් 2015.08.03 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

05. විභාග පරිපාටිය :

මෙය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් යුක්තය. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| (i) | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| (ii) | තනතුරට අදළ ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද | 50 |
| (iii) | වෘත්තීය සුදුසුකම් | 15 |
| (iv) | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 |
| | මුළු ලකුණු | 100 |

- ඉහත වගුවෙහි දක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත එම ලකුණු ප්‍රදනය කිරීම සඳහා වන විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතුරින් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව, පවතින පුරප්පාඩුවට බඳවාගනු ලැබේ.

06. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට හැකිය.

07. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 250 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ 2015.08.03 දින හෝ එදිනට පෙර හෝ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට හෝ පමණක් ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට් පතෙහි ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

08. අයදුම්පත්‍රය A4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදසි භාවිතා කරමින්

(අ) අංක 1 සිට 3 තෙක් ඡේදයන් පළමු පිටුවටද,
(ආ) අංක 4 සිට 8 තෙක් ඡේදයන් දෙවන පිටුවටද,
(ඇ) අංක 09 සිට 11 තෙක් ඡේදයන් තෙවන පිටුවටද ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද ඇතුලත්වන සේ, අයදුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.
(ඈ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයෙහි සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

- නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය *ගැසට්* නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බලා තහවුරු කර ගත යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙලවරේ ''යන්ත්‍ර සහායක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2015'' යන්න සඳහන් කරන්න.

8.3 අයදුම්පත්‍රයේද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, නීතිඥවරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, රු. 240,260 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2015.08.03 වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර එදින හෝ එදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

9. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නම, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක, ෆැක්ස් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රවේශපත්‍රයේ පිටපතක් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන්කොට, එම ලිපිය ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම සුදුසුය. තවද, ඔබගේ තොරතුරු සනාථ කිරීම සඳහා ඔබ ලඟ තබාගත් අයදුම් පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සුදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. අපේක්ෂකයෙකු හට ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන නීති රීති වලට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම

අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවා ගණය - යන්ත්‍ර සහායක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය - 2015

Primary Level unskilled service category - structured interview for recruitment to the Post of Machine Helper grade III - 2015

(දෙන ලද කොටුව තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න.)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පෙනී සිටින භාෂා මාධ්‍ය :-

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

3.3 2015.08.03 දිනට වයස : අවුරුදු : මාස : දින :

3.4 දුරකථන අංකය :

4.0 අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.0 වෘත්තීය සුදුසුකම් :

| පාඨමාලාව | හැදෑරූ වර්ෂය | තාක්ෂණික ආයතනය | NVQ මට්ටම |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

6.0 අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද :————.

7.0 වෙනත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

8.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් නැත

.............................................................................
.............................................................................
.............................................................................

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍යයැයි ඔප්පුවුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ......... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද,එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදරිපත් කරන ................. මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................. ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

07-293

---

## නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණ සේවා ගණයේ තාක්ෂණ නිලධාරි තනතුරෙහි පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2015

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණ සේවා ගණයේ තාක්ෂණ නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු 02 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ සීමිත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් පහත උපදෙස් අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ" තාක්ෂණ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2015.08.03 දින වේ.

සටහන : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳදරාගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*
"ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ."

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*
(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩබැලීමේ කාලසීමාවකට යටත් වේ.

(iii) පළමු වසරක කාල සීමාව තුළ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු හා ඉංජිනේරු (සිවිල්/යාන්ත්‍රික) ගේ අධීක්ෂණය යටතේ නියමිත විෂය නිර්දේශයට අනුව පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කළ යුතු ය. වසරක පුහුණුව අවසානයේ පරීක්ෂණ කමිටුවකින් ලබා දෙන නිර්දේශය අනුව තාක්ෂණ නිලධාරි තනතුරෙහි III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පරීක්ෂණ කමිටුවේ නිර්දේශය මත පුහුණු කාලය දීර්ඝ කිරීමට හැකි ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 (II) අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05 ක් තුළ දී ලබා ගත යුතු ය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(vi) නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ/කාර්මික විද්‍යාලවල වුව ද සේවය කිරීමට හැකි විය යුතු ය.

3. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 (iv) දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN-3-2006 (ඒ) රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ.

4. (1) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයනට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

4. (2) *වෘත්තීය සුදුසුකම් :*

තනතුරට අදාළව පහත සඳහන් වෘත්තීය සුදුසුකමක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 5 ක පළපුරුද්ද,

(i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම. (උදාහරණ : ජාතික තාක්ෂණ සහතිකය සිවිල්/විදුලි/යාන්ත්‍රික);

*හෝ*

(ii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

*හෝ*

(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. *පළපුරුද්ද :*

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත, තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

6. *කායික සුදුසුකම් :*

ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණ ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම් :*

(i) දැනට දරන තනතුරෙහි පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

(ii) නියමිත දිනට පූර්වාසන්නව රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

8 (1) ලිඛිත විභාගය :

| *විෂයයන්* | *කාලය පැය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 01 | 100 | 40% | කාලීන, සමාජීය, සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර් ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය. ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 03 | 100 | 40% | තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. සෑම ප්‍රශ්නයක් සඳහා ම සමාන ලකුණු ලැබේ. |

8.(2) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :* (ලකුණු ලබා දෙනු නොලැබේ.)

*ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :* බඳවා ගැනීම් පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

9. විභාග කොන්දේසි :

(i) විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(iii) තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත; හෝ

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය, හෝ

පමණක් පිළිගැනේ.

(iv) විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(vi) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(vii) මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹ විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ.

10. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

(i) ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවට ද, අනිකුත් කරුණු ඊළඟ පිටුවලටද වන සේ සකස් කර තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කළ යුතුය.

(ii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

(iii) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත් සම්පූර්ණ කළ යුතු වේ.

(iv) විභාග ගාස්තුව රු. 400 ක් වන අතර එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ ''අංක 176-100-139026228'' දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින්ම ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙනසේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ කුවිතාන්සියේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

(v) සෑම අයදුම්කරුවකුම තම අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු.240,360 ක් ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(vi) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(vii) අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

12. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

ජේ. ඒ. රංජිත්,
අධ්‍යක්ෂ ජනරාල්,
කාර්මික අධ්‍යාපන හා
පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

කාර්මික අධ්‍යාපන හා පුහුණු
කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ - 10.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයදුම්පත්‍රය

***කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණ සේවා ගණයේ තාක්ෂණ නිලධාරී තනතුරෙහි පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2015***

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐ සිංහල - 1 දෙමළ - 2

1. අයදුම්කරුගේ නම :
   (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. සේවා ස්ථානය :————.

3. පෞද්ගලික ලිපිනය :————.

4. (i) ස්ත්‍රී පුරුෂ භාවය :————.

   (ii) උපන් දිනය :

   අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. (iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

   අවුරුදු :————. මාස :————. දින :————.

(iv) ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

(v) දුරකථන අංකය : | | | | | | | | | | |

5. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා. පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6. වෘත්තීය සුදුසුකම් :

| විභාගය/ ඩිප්ලෝමාව | වර්ෂය | පෙනී සිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

7. පළපුරුද්ද පිළිබඳ විස්තරය :

| සේවය කළ ආයතනය | තනතුර | සේවය කළ කාලය |
|---|---|---|
| | | |

8. සේවා විස්තර :

(i) ඔබ දැනට සේවය කරන තනතුර :————.

(ii) දැනට දරන තනතුර පත්වූ දිනය :————.

(iii) දැනට දරන තනතුර ස්ථිර කළ දිනය :————.

(iv) දැනට දරන තනතුර ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ ගොනු අංකය හා දිනය :————.

(v) වැටුප් පරිමාණය (රා. ප. ච. 6/2006 (iv) අනුව :————.

(vi) දැනට ලබන මාසික වැටුප :————.

(vii) දැනට දරන තනතුරේ සේවා කාලය :————.

9. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————.

මුදල් ගෙවූ දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙනසේ අමුණා, එවිය යුතුය.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත් පත් කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අත්සන සහතික කිරීම*

................. තාක්ෂණ හා කාර්මික විද්‍යාලයේ/ප්‍රධාන කාර්යාලයේ නිලධාරියෙකු සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ......... මහතා/මිය/මෙනවිය ......... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි.)

ආයතන ප්‍රධානියාගේ සහතිකය

1. මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන.........මහතා/ මහත්මිය/ මෙනෙවිය මෙම විද්‍යාලයේ/කාර්යාලයේ සේවයේ නියුක්ත අයෙකු බවද,
2. ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බවද,
3. ඔහු/ඇය ස්ථිර තනතුරක........ දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බවද,
4. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බවද,
5. ඔහු/ඇය......... වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කර ඇති බවද,
6. ඔහු/ඇය මෙම ගැසට් නිවේදනයේ 05 වැනි ඡේදයේ නියමිත තනතුරක සේවය කරමින් සිටින බවද,
7. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම......... වැනි දිනට පූර්වාසන්න අවුරුදු 05 ඇතුළත සතුටුදායකව පැවති බවද,
8. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බවද, මම සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව)

07-158

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ තාක්ෂණ නිලධාරි තනතුරෙහි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ තාක්ෂණ නිලධාරි තනතුරුවල පවතින පුරප්පාඩු 06 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් පහත උපදෙස් අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව තැ. පෙ. 557, ඔල්කොට් මාවත, කොළඹ 10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවරේ" තාක්ෂණ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය" යනුවෙන් පැහැදිළිව සටහන් කල යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2015.08.03 දින වේ.

***සටහන*** : ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳදරාගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
"ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ."

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :
(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව වසර 05ක් තුළ දී II කණ්ඩයට අයත් දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

(v) නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ/කාර්මික විද්‍යාලවල වුව ද සේවය කිරීමට හැකි විය යුතු ය.

3. *වැටුප් පරිමාණය* :
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) දරන වැටුප් චක්‍රලේඛයට අනුව MN-3-2006 (ඒ) රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. (i) *අධ්‍යාපන සුදුසුකම්* :

1. අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම;

සහ

(2) අ. පො. ස. (උ.පෙ.) විභාගයේ ක්ෂේත්‍රයට අදාළ විෂයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන් යටතේ සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුන (03) කින් එකවර සමත්ව තිබීම.)

4. (ii) *වෘත්තීය සුදුසුකම්* :

1. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික ඩිප්ලෝමාව,
හෝ
2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව,
හෝ
3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,
හෝ
4. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව, හෝ
5. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව,
හෝ
6. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,
හෝ
7. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

8. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

5. *වයස් සීමාව* :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

6. *කායික සුදුසුකම්* :

සෑම අපේක්‍ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කලයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8 (i) *ලිඛිත විභාගය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය පැය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්‍ෂණය | 01 | 100 | 40% | කාලීන, සමාජීය, සිදුවීම් පිළිබඳ අවබෝධය හා අන්තර් ජාතික සිදුවීම් පිළිබඳ දැනුම හා නිර්මාණාත්මක චින්තන ශක්තිය, ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව මැන බැලීමට අදාළ කෙටි ප්‍රශ්න පත්‍රයකි. |
| 2. තාක්‍ෂණික හා විෂයානුබද්ධ දැනුම | 03 | 100 | 40% | තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 ක් සඳහා පිළිතුරු සැපයිය යුතු ය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ. |

8 (ii) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :* (ලකුණු ලබා දෙනු නොලැබේ.) ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීම් පරිපාටි හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සුදුසුකම් සපුරා තිබේදැයි පරික්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරික්ෂා කිරීම.

9. *විභාග කොන්දේසි :*

(i) විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(iii) තමා පෙනී සිටින සෑම විෂයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. මේ සඳහා,

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත; හෝ

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

(iv) විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

(vi) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(vii) මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹ විභාග මධ්‍යස්ථානවල දී පමණක් පවත්වනු ලැබේ.

10. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවට ද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස්කර තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කළ යුතු ය.

(ii) ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

(iii) විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත් සම්පූර්ණ කළ යුතු වේ.

(iv) විභාග ගාස්තුව රු.400 ක් වන අතර, එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176-100-139026228 දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය නොගැලවෙනසේ ඇලවිය යුතු ය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ කුවිතාන්සියේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

(v) සෑම අයදුම්කරුවකුම තම අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360 හෝ ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ

ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

vi. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

vii. අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. පුරප්පාඩු වලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

12. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

ජේ. ඒ. රංජිත්,<br>
අධ්‍යක්ෂ ජනරාල්,<br>
කාර්මික අධ්‍යාපන හා<br>
පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.

කාර්මික අධ්‍යාපන හා පුහුණු<br>
කිරීමේ දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 10

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ තාක්ෂණ නිලධාරී තනතුරෙහි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2015

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :<br>
සිංහල - 1 දෙමළ -2

1. අයදුම්කරුගේ නම :
   (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය හා දුරකථන අංකය :
   (i) කාර්යාලීය ලිපිනය :————.<br>
   දුරකථන අංකය :————.

   (ii) පෞද්ගලික ලිපිනය :————.<br>
   දුරකථනය අංකය :————.

(ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතු ය.)

3. උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

   අවුරුදු :————. මාස :————. දින :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය:————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා. පෙළ) විභාගය

වර්ෂය :———. විභාග අංකය :———.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ. පෙළ) විභාගය

වර්ෂය :———. විභාග අංකය :———.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් :

| විභාගය/ ඩිප්ලෝමාව | වර්ෂය | පෙනී සිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තරය :

| සේවය කළ ආයතනය | තනතුර | සේවය කළ කාලය | රාජ්‍ය අංශය/ අර්ධ රාජ්‍ය අංශය/ පෞද්ගලික අංශය යන වග |
|---|---|---|---|
| | | | |

11. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් පෙළපතින් ද/ ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න. :————.
(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න.)

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකර තිබේ ද ? :——.

13. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද? :——.

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

15. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :————.
මුදල් ගෙවූ දිනය :————.

| කුවිතාන්සිය නොගැලවෙනසේ අමුණා එවිය යුතු ය. |
|---|

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහකිරීමටත් යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ......... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන.

දිනය :————.

**(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන් ට පමණි.)**

*දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ....................... මයා./මිය./මෙනවිය දැනට ............ තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීමත් සතුටුදායක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම කුවිතාන්සිය අලවා ඇති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය/නොහැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව)

07-159

---

## ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/තාක්ෂණික නිලධර ගණයේ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014 (2015)

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/තාක්ෂණික නිලධර ගණයේ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරු පුරප්පාඩු 578ක් සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාග උපලේඛනය - 1හි දක්වා ඇති නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ. අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරනු ලබන නගරය එම ලේඛනයට අනුවම විය යුතු අතර, ඉල්ලුම් කරන ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ආසන්න වෙනත් නගරයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම්, විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

1 වැනි උපලේඛනය

**විභාග මධ්‍යස්ථාන**

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |

| නගරය | නගර අංකය |
|---|---|
| හම්බන්තොට | 08 |
| මාතර | 09 |
| යාපනය | 10 |
| කිලිනොච්චිය | 11 |
| මන්නාරම | 12 |
| මුලතිව් | 13 |
| වවුනියාව | 14 |
| අම්පාර | 15 |
| මඩකලපුව | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| කෑගල්ල | 24 |
| රත්නපුර | 25 |

02. *භාෂා මාධ්‍යය.*—විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

03. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි හා ගණිතය යන විෂයයන්ට සම්මාන සහිතව සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සමග එක් වරකදී විෂයයන් 6කින් අ.පො.ස. (සා.පෙළ) සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් සමත් වී තිබීම.)

(ආ) *වෘත්තීය සුදුසුකම් :*

පරිගණක වදන් සාක්ෂරතාව පිළිබඳ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයක පැය 360කට නොඅඩු පාඨමාලාවක් (Computer Application Asisstant) NVQ Level 3 හෝ ඊට ඉහළ පාඨමාලාවක් සම්පූර්ණ කළ බවට සහතිකයක් ලබා තිබීම.

**සටහන :** ඔබ හදරා ඇති පාඨමාලාව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ආයතනයක් හා පාඨමාලාවක් ද යන වග www.tvec.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් තහවුරු කරගත හැකිය.

(ඇ) *කායික සුදුසුකම් :*

සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඈ) *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම අයදුම් කළ හැකිය.
(iv) 2015.07.27 වැනි දිනට ඉහත 3 (අ) සහ (ආ) හි දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

04. *වයස* :— අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. ඒ අනුව 1997.07.27 දිනට හෝ ඊට පෙර හා 1985.07.27 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

05. *වැටුප් පරිමාණය* :— රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) ට අනුව මාසික වැටුප් පරිමාණය රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 (MN 3 - 2006A)

06. *අයදුම් කිරීමේ ක්‍රමය* :

(අ) මෙම නිවේදනයේ අගට යොද ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඒ 4 (සෙ.මී. 21x30) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය. අංක 01 සිට 03 දක්වා ශීර්ෂ පළමු වන පිටුවෙහි ද, ඉතිරිය ඊළඟ පිටුවලට ද, ඇතුළත් වන පරිදි සකස් කර ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පත් තැපැල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.slpost.gov.lk මගින් ද ලබා ගත හැකි ය.

(ආ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.07.27 දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/තාක්ෂණික නිලධර ගණයේ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2014 (2015)" යන්න සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඇ) රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(ඈ) නියමිත වයස් සීමාවට අයත් නොවන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති හා අයදුම්පත්‍ර කැඳවන අවසාන දිනට පසුව මුදල් ගෙවූ කුවිතාන්සි ඇතුළත් අයදුම්පත්, මුදල් ගෙවූ කුවිතාන්සි අලවා නොමැති අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලද බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

(ඉ) අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම වඩාත් එලදයි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදනමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(ඊ) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

විභාග ශාලාව තුළ දී විභාග අපේක්ෂකයින් ශාලාධිපති වෙත තම අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත ලේඛනවලින් ඕනෑම එකක් පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

07. *විභාග ගාස්තු ගෙවීම* :

(අ) මෙම විභාගය සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකු විසින් ම විභාග ගාස්තු ලෙස රු. 600ක මුදලක් ගෙවිය යුතුය. එම ගාස්තුව විභාග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවෙන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි එක් දරයකින් ඇලවිය යුතුය. විභාග ගාස්තුව ගෙවන ලද ලදුපත අයදුම්කරුගේ නමින්ම

නිකුත් කර තිබිය යුතුය. කුවිතාන්සියෙහි ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම දැන්වීමේ සඳහන් නොවන අයුරින් මුදල් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය සහිත අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, කුමන හේතුවක් නිසාවත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

08. *සේවයේ නියුක්ත කිරීමේ වගන්ති හා කොන්දේසි :*

(අ) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් එම අවස්ථාව වන විට රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර නොසිටී නම් ඔවුන් තුන් අවුරුදු පරිවාස කාලයක් මත අදළ තනතුරට පත් කරනු ඇත. රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු නම් ඔහුගේ පත්වීම එක් අවුරුදු වැඩබැලීම් කාලයකට යටත් වනු ඇත.

09. *විභාග ක්‍රමය ඃ*

මෙම විභාගය පහත සඳහන් පරිදිවන ලිඛිත ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. ඃ-

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | පැය 01 1/2 | 100 | 40% |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමි වේ.<br><br>I වැනි කොටස<br><br>මෙම කොටසට රචනයක් හා සාරාංශයක් ලිවීම ඇතුළත් වේ. අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශනය, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම, භාෂා අවබෝධය, අක්ෂර වින්‍යාසය හා සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ හැකියාව මෙමගින් මැන බලනු ලැබේ.<br><br>II වැනි කොටස<br><br>(අ) භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහීම පරීක්ෂා කිරීම පිණිස සැකසුනු පාඨයන් ආශ්‍රයෙන් පදයන්ගේ අර්ථය, තනි වාක්‍යයකින් ප්‍රකාශ කිරීම, ඒ පිළිබඳව විවරණාත්මක සටහන් ලියා දැක්වීම, විකල්ප කාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දැක්වීම, පිළිතුරු කීපයක් අතරින් නිවැරදි පිළිතුර තෝරා දැක්වීම.<br><br>(ආ) සමානාර්ථ, විරුද්ධාර්ථ පද පිළිබඳ අවබෝධය, භාෂාව භාවිතයේ දී අනුගමනිත උපායමාර්ග පිළිබඳ දැනුම මෙමගින් මැන බලනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ හා විග්‍රහ ශක්තිය හා නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොටගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය සංඛ්‍යාමය කුසලතාව, ගණිත ගැටලු ආශ්‍රිත බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |

සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය.

10. *තෝරා ගැනීමේ ක්‍රමය :*

(අ) මෙම තනතුරු සඳහා ඉහත 03 ඡේදයේ දක්වා ඇති සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසු සුදුස්සන් තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර, සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.)

(ආ) විභාග ප්‍රතිඵල මත කුසලතාව අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, අයදුම්පත් කැඳවන අවසාන දිනට, නිවේදනය ප්‍රකාර සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවන් පත්වීමක් ලැබීමට සුදුසුකම් නොලබන්නේ ය.

(ඇ) ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව සකසන ලද ප්‍රමුඛතා ලේඛනයේ වැඩිම ලකුණු ලැබූ අයදුම්කරුගේ සිට අනුපිළිවෙලින් පිරවීමට නියමිත පුරප්පාඩු ගණන සඳහා පත්වීම් පිරිනැමීම සඳහා අයදුම්කරුවන් තෝරාගනු ලැබේ.

(ඉ) ලිඛිත පරීක්ෂණයේදී එක් එක් විෂයයෙන් ලකුණු 40%කට නොඅඩුව ලබා ගන්නා අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය තැපැල්පති වෙත ලබා දෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම හෝ කෙරෙනු ඇත.

11. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. *සාවද්‍ය තොරතුරු සැපයීම.*—මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුව වුව ද, අපේක්ෂකයකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කර ඇති බව පෙනී ගියහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයේ සඳහන් නොවන වෙනත් ඕනෑම කරුණක් පිළිබඳව අවසාන තීරණයක් ගැනීම තැපැල්පති සතු වන්නේ ය.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඩී. එල්. පී. ආර්. අභයරත්න,
තැපැල්පති.

*ආදර්ශ අයදුම්පත්‍රය*

ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/තාක්ෂණික නිලධර ගණයේ III ශ්‍රේණියේ තැපැල් සේවා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014/(2015)

Open Competitive Examination for making recruitment for the posts of Grade III Postal Service Officers of Technical/ Non-Technical Officer Category - Supervising Management Assistant of the Postal Department, Sri Lanka - 2014 (2015)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කරන නගරය

| නගරය | නගර අංකය |
|---|---|
| | |
| | |

විභාගයට පෙනී සිටින මාධ්‍යය :
(ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක) ☐
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. නම :
(i) මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : GUNAWARDHANA M. G. B. S. K.

(ii) සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii) සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. ලිපිනය
(i) ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

(iii) පදිංචි දිස්ත්‍රික්කය :————.

(iv) ප්‍රවේශ පත් එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03.
(i) ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(iii) උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(iv) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :
(2015.07.27 වැනි දිනට වයස)

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

(v) විවාහක/අවිවාහක බව : විවාහක - 1 ☐
අවිවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. අධ්‍යාපන සුදුසුකම් ඃ

(*a*) අ. පො. ස. (උ/පෙළ) විභාග පිළිබඳ විස්තර ඃ

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

(iii)

| | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

(*b*) අ. පො. ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

(iii)

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(*c*) වෘත්තීය සුදුසුකම් (තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක පරිගණක වදන් සාක්ෂරතාව පිළිබඳ පැය 360කට නොඅඩු පරිගණක පාඨමාලා පිළිබඳ විස්තර) ඃ

| පාඨමාලාවේ නම | නිකුත් කළ ආයතනයේ නම හා එම ආයතනය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති අංකය | පාඨමාලාව හැදෑරූ කාල සීමාව හා පැය ගණන |
|---|---|---|
| | | |
| | | |
| | | |

05. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.)

ඔව් නම්, ඒ සම්බන්ධ විස්තර සඳහන් කරන්න :————.

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.

විභාග කුවිතාන්සි අංකය :————.

දිනය :————.

| |
|---|
| විභාග කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

07. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් සඳහන් කරමි. මෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පෙරාතුව සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වරද අනාවරණය වූයේ නම් වන්දියක් නොමැතිව වහාම මා සේවයෙන් පහ කළ හැකි බවත් මම හොඳාකාරවම දනිමි.

තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද, මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ......... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

නිල මුද්‍රාව :————.

09. *ආයතන ප්‍රධානියාගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා) ඃ*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා./මිය./මෙනවිය ................. කාර්යාලයේ/ආයතනයේ ......... දින සිට ......... තනතුරක සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදයක වන බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බව ද/කළ නොහැකි බව ද ඇය/ඔහු මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය (නිල මුද්‍රාව තබන්න.) :————.

07-516

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| **ජූලි** | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2015.08.07 | සිකුරාදා | 2015.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.14 | සිකුරාදා | 2015.07.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.08.21 | සිකුරාදා | 2015.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.28 | සිකුරාදා | 2015.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2015.09.04 | සිකුරාදා | 2015.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.11 | සිකුරාදා | 2015.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.18 | සිකුරාදා | 2015.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.25 | සිකුරාදා | 2015.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.